# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,472 - 2026 ජනවාරි මස 23 වැනි සිකුරාදා - 2026.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | - |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 13 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 30 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2026 ජනවාරි මස 01 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


00 - B 82757 - (2026/01)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ් වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

### සහකාර පාලක/ ගාස්තු අයකිරීමේ සහකාර/ විදුලි කාර්මික/ සත්ත්ව භාරකරු/ හස්ති භාරකරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම - 2026

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :-

**01.**

| අනු අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගැනීමේ සුදුසුකම් | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|
| 01 | සහකාර පාලක (සත්ත්ව/ මත්ස්‍ය/ උරග/ උද්‍යාන) (MN-01) | 02 | ✓ **අධ්‍යාපන සුදුසුකම් -**<br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව/ ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.<br>I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා අංශයෙන් විෂයයන් දෙකක් (02) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.<br>II. පැරණි නිර්දේශය අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා අංශයෙන් විෂයයන් තුනක් (03) සමත් ව තිබීම.<br>➢ **වෘත්තීය සුදුසුකම් -** **තනතුරට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් සේ සැලකේ.** | රු. 45,230 - 10x540- 11x630 - 10x890 - 10 x 1,190 - රු.78,360/- |
| 02. | ගාස්තු අයකිරීමේ සහකාර (MN - 01) | 02 | ✓ **අධ්‍යාපන සුදුසුකම් -**<br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව/ ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (1) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br>➢ **වෘත්තීය සුදුසුකම් - අදාළ නොවේ.** | රු. 45,230 - 10x540 - 11x630 - 10x890 - 10 x 1,190 - රු. 78,360/- |
| 03. | විදුලි කාර්මික ශිල්පී (PL - 03) | 04 | ✓ **අධ්‍යාපන සුදුසුකම් -**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. | රු. 42,780 - 10x490 - 10x540 - 10x590 - 12x630 - රු. 66,540/- |

| අනු අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගැනීමේ සුදුසුකම් | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|
| | | | ➢ **වෘත්තීය සුදුසුකම්**<br><br>විදුලි කාර්මික ශිල්පි - විදුලි කර්මාන්තය සම්බන්ධයෙන් ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) 4 මට්ටමට අදාළ සහතිකයන් ලබා තිබීම. | |
| 04. | සත්ත්ව භාරකරු (PL - 02) | 10 | ✓ **අධ්‍යාපන සුදුසුකම්**<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.<br><br>➢ **වෘත්තීය සුදුසුකම්**<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම. | රු. 41,800 - 10x490 - 10x540 - 10x590 - 12x630 - රු. 65,560/- |
| 05. | හස්ති භාරකරු (PL - 02) | 02 | ✓ **අධ්‍යාපන සුදුසුකම්**<br><br>8 වසර සමත් වීම<br><br>➢ **වෘත්තීය සුදුසුකම්**<br><br>අලි ඇතුන් රැකබලා ගැනීම පිළිබඳ දැනුම සහ අලි ඇතුන්ට දේශීය බෙහෙත් කිරීමේ හැකියාව | රු. 41,800 - 10x490 - 10x540 - 10x590 - 12x630 - රු. 65,560/- |

02. බඳවා ගන්නා ක්‍රමවේදය

**පළපුරුද්ද**

i. සහකාර පාලක/ ගාස්තු අයකිරීමේ සහකාර/ විදුලි කාර්මික/ සත්ත්ව භාරකරු/ හස්ති භාරකරු - ඉල්ලුම් කරන තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (03) පළපුරුද්ද

03. **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

04. **වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුතු විය යුතු ය.

05. **වයස :**

සහකාර පාලක/ ගාස්තු අයකිරීමේ සහකාර - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට එනම් 2026.02.27 දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 30ට නොවැඩි විය යුතු ය.

විදුලි කාර්මික/ සත්ත්ව භාරකරු/ හස්ති භාරකරු - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට එනම් 2026.02.27 දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.

06. **බඳවා ගැනීමේ ක්‍රමය :**

| | |
|---|---|
| සහාකාර පාලක/ ගාස්තු අයකිරීමේ සහකාර | - ලිඛිත පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| විදුලි කාර්මික | - වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| සත්ත්ව භාරකරු/ හස්ති භාරකරු | - ප්‍රායෝගික හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

07. **විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :** විභාගය **සිංහල සහ දෙමළ** යන මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ.

*සටහන* - අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය. තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ.

08. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත ලේඛනවලින් එකක් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

තවද, අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී විමසන ඕනෑම අවස්ථාවක පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටිය යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. ජාතික හැඳුනුම්පත,
III. අධ්‍යාපන සහතික හා ශිෂ්‍ය කාර්‍ය දර්ශකය,
IV. පළපුරුද්ද පිළිබඳ සහතික,
V. චරිත සහතික දෙකක් (ග්‍රාම නිලධාරි සහතිකය හා පොලිස් වාර්තාව).

***සැලකිය යුතු ය:***

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් ඇමිණීමෙන් වැළකී සිටිය යුතු ය.

(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වල සහතික ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවක දී එම ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

09. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

i. අයදුම්පත් 2026.02.27 දිනට හෝ ඊට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, දෙහිවල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ.

iii. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"අදාළ තනතුර"** සඳහන් කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ නීතිඥවරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු. 71,240/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

v. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

10. තනතුරට බඳවා ගැනීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම** - අපේක්ෂකයෙකුට ඉහත සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

***සැ. යු. -*** අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමය පරිදි අදාළ සම්මුඛ පරීක්ෂණ හා විභාග කොළඹ දිස්ත්‍රික්කයේ දී පමණක් පැවැත්වේ.

රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති නිලධාරි කමිටුවේ නියමය පරිදි.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව.

2026 ජනවාරි මස 08 දින,
දෙහිවල දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ තනතුරුවලට අදාළව නිලධාරින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026**

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
: ……………………………………………………………………………………………………………
උදා: NIMAL A. B. C. D.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසියෙන්) :
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

03. සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

04. ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ 0 ස්ත්‍රී 1 [ ]

05. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

06. උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය: [ | ] දිනය : [ | ]

2026.02.27 දිනට වයස : අවු. : [ | ] මාස : [ | ] දින : [ | ]

07. දුරකථන අංකය : ජංගම : [ | | | | | | | | | ]

ස්ථාවර : [ | | | | | | | | | ]

08. වෘත්තීය සුදුසුකම් :- තනතුරට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

09. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :- ……………………………………………………………………
……………………………………………………………………………………………………………

10. ඉල්ලුම් කරන තනතුර :- ……………………………………………………………………………

11. ඔබ NVQ සමත් වී ඇත්නම් පමණක් ලබා ඇති නිපුණතා මට්ටම :- ………………………………………

12. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවයට ලබා ඇති ඉහළම සුදුසුකම :
……………………………………………………………………………………………………………

13. වෙනත් සුදුසුකම් : ……………………………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

14. **ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳව විස්තර :**

ආයතනය - ……………………………………………………………………………………………………………
මුල් පත්වීමේ දිනය - ……………………………………………………………………………………………
තනතුර - …………………………………………………………………………………………………………

15. **ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් හා දුරකථන අංකයන් සඳහන් කරන්න**

1. ……………………………. 2. ……………………………..
……………………………..   ……………………………..
…………………………….   ………………………………

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවට සහතික වෙමි.

……………………………. ………………………………..,
දිනය අයදුම්කරුගේ අත්සන.

16. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ………………………………….. පදිංචි ………………………… නැමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2026 …………….. මස………….. දින ………….. දී ඔහු/ ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

නම හා පදවි නාමය : …………………………...........
නිල මුද්‍රාව : …………………………………
දිනය : ………………………………….

01-242

---

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

### ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය (PL3) සඳහා බඳවා ගැනීම - 2026

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයේ (PL3) ජලනළ කාර්මික තනතුර සඳහා බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම බඳවා ගැනීම සිදුකරනු ලබන්නේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයේ ජලනළ කාර්මික තනතුර සඳහා වේ. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026 පෙබරවාරි මස 27 දින වේ.**

02. සේවා කොන්දේසි :

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, 2018.07.12 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ජලනල කාර්මික තනතුර සඳහා පත්කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද, අනාගතයේ දී බඳවා ගනු ලබන නිලධාරීන් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයේ (PL 3) ජලනළ කාර්මික III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඇ) තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

(ඉ) තනතුරට පැවරෙන කාර්යයන් :

| *අනුමත තනතුරු නාම* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| ජලනල කාර්මික | III | 01 | දෙපාර්තමේන්තුවේ ජලනල පද්ධතිය නඩත්තුව, පවත්වාගෙන යාම, හදිසි ජල කාන්දු අවස්ථාවලදී අවස්ථාවට උචිත ප්‍රතිකර්ම යෙදීම, ශාඛා කාර්යාලවල ජලනල අලුත්වැඩියා හා නඩත්තු කටයුතු ඉටුකිරීම සහ අධීක්ෂණ නිලධාරි/ පරිපාලන නිලධාරි, ජාතික ලේඛනාගාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පාලන), ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ (පාලන) හෝ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන් |

03. මාසික වැටුප් පරිමාණය:

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 චක්‍රලේඛය අනුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයේ (PL3) ජලනළ කාර්මික III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය (PL 03 - 2025) රු. 42,780 – 10 x 490 – 10 x 540 – 10 x 590 – 12 x 630 - රු. 66, 540/=

(ආරම්භක වැටුප් පියවර - රුපියල් 42,780.00) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම

(ආ) වෘත්තීය සුදුසුකම් :

ජලනළ කාර්මික ශිල්පය පිළිබඳ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) හතර (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

(ඇ) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(ඈ) වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සටහන* :- ක්ෂෙත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතාවන් හි N.V.Q. 03 මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත (අ) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවේ.

(ඉ) *වයස :* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

05. **බඳවා ගැනීමේ ක්‍රමය :**

වෘත්තීය පරීක්ෂණයක් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

(අ) වෘත්තීය පරීක්ෂණය :

ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

| *පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *මුළු ලකුණු* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| ද්‍රව්‍ය පිළිබඳ අවබෝධය | 20 | 100 | 40 |
| උපකරණ භාවිතය | 30 | | |
| සැලසුම් කියවීම, අවබෝධ කර ගැනීම හා සැලසුම් සැකසීමේ හැකියාව | 30 | | |
| විවිධ පිරිද්දුම් සැකසීම සහ ඒවායේ භාවිත පිළිබඳ අවබෝධය | 20 | | |

(ආ) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

i. ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ විෂයය පිළිබඳ දැනුම, අමතර අධ්‍යාපන සුදුසුකම්, අමතර වෘත්තීය සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහි දී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. *අතිරේක අධ්‍යාපන සුදුසුකම් :*<br>AutoCAD, Technical Drawing, Construction Safety වැනි අමතර විෂයයන් පිළිබඳ පාඨමාලා සඳහා<br>(i) මසකට වැඩි ලකුණු 03 බැගින්<br>(ii) මාස තුනකට වැඩි ලකුණු 05 බැගින්<br>(iii) මාස හයකට වැඩි ලකුණු 15 බැගින් | 15 | අදාළ නොවේ. |
| 2. පළපුරුද්ද (ක්ෂේත්‍රයට අදාළව රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.) වසරකට ලකුණු 12 බැගින් උපරිම වසර 05 ක් සඳහා | 60 | |

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 3. ක්ෂේත්‍රයට අදාළව රජය විසින් පිළිගත් ආයතනයකින් හදාරා ඇති අමතර පාඨමාලා හා ලබා ඇති පුහුණුවීම්<br>තාක්ෂණික විද්‍යාලයකින් හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් Plumbing, Pipe Fitting, Sanitary Systems ආදී පාඨමාලා සඳහා<br>(i) මසකට වැඩි ලකුණු 02 බැගින්<br>(ii) මාස තුනකට වැඩි ලකුණු 05 බැගින්<br>(iii) මාස හයකට වැඩි ලකුණු 10 බැගින් | 10 | |
| 4. *අමතර සුදුසුකම් :*<br>වාණිජ, නේවාසික, කාර්මික ව්‍යාපෘතිවල වැඩ කළ අත්දැකීම්<br>එක් ව්‍යාපෘතියක් සඳහා ලකුණු 05 බැගින් (අදාළ ආයතනයකින් ලබාගත් සහතිකයකින් හෝ ලිපියකින් තහවුරු කළ යුතුය.) | 10 | |
| 5. *සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාව :*<br>(i) සන්නිවේදන කුසලතා 01<br>(ii) ආකල්ප 02<br>(iii) ප්‍රායෝගික දැනුම 02 | 05 | |
| **එකතුව** | **100** | |

ii. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව්ගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ දී හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව තනතුරට බඳවා ගනු ලැබේ. මූලික සුදුසුකම් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම පරීක්ෂා කරනු ලැබේ.

06. *පත්වීම් ලබා දීම :*

i. පුරප්පාඩු සංඛ්‍යාව 01 කි.
පුරප්පාඩුව සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019(II) අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරනු ලැබේ.

ii. වෘත්තීය පරීක්ෂණයේ දී හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයේ ජලනල කාර්මික III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර තෝරාගන්නා අපේක්ෂකයින් අතරින් අයකු යම් කරුණක් හේතුවෙන් පත්වීම භාර නොගැනීම හෝ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් පුරප්පාඩු ඇති වුවහොත්, කුසලතා අනුපිළිවෙළ අනුව අනෙකුත් අපේක්ෂකයින් තෝරාපත් කිරීම ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

07. *අයදුම් කිරීමේ ක්‍රමය :*

(අ) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය 8 ½ " x 12" (ඒ4) කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. පරිගණකයෙන් සකස් කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 09 තෙක් පළමු පිටුවට ද, ඉතිරිය සෙසු පිටුවලට ද ඇතුළත්වන පරිදි අයදුම්පත සකස් කළ යුතු ය.

අයදුම්පත එක් භාෂාවකින් පමණක් සම්පූර්ණ කළ යුතු ය.

(*ආ*) ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද අයදුම්පත නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(*ඇ*) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026.02.27 දිනට හෝ ඊට පෙර** ලැබෙන පරිදි "ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07." යන ලිපිනයට එවිය යුතු ය.

අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණයේ ජලනළ කාර්මික III ශ්‍රේණියට බඳවා ගැනීම -2026"** යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. **2026.02.27** දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

(*ඈ*) අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(*ඉ*) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරු විසින්ම විඳදරා ගත යුතු ය.

(*ඊ*) අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ පිළිබඳව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ දුරකතන අංක 011 - 269 6072, 011-269 6075 හෝ 011 – 268 8758 ඔස්සේ සතියේ වැඩ කරන දිනයන්හි **පෙ.ව. 08.30 සිට ප.ව. 4.00** දක්වා විමසිය හැකිය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද තනතුරේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය.

*සටහන* - අයදුම්කරුවෙකු වෘත්තීය පරීක්ෂණයට කැඳවීම හෝ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම පත්වීම ලබාදීම සඳහා සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් වෘත්තීය හා යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණ පවත්වන කාලයේදී හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ. වෘත්තීය හා යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

09. වෙනත් කරුණු

මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.

2026 ජනවාරි මස 23 දින,
අංක 07,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ශ්‍රේණියේ**
**ජලනළ කාර්මික තනතුර සඳහා බඳවා ගැනීම - 2026**

**Recruitment to the post of Primary Level Skilled Service Plumber of the Department of National Archives - 2026**

01. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා: HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKA)
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

02. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා: H.M.S. RATHNAYAKA)
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

03. සම්පූර්ණ නම (සිංහලෙන්) :
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

04. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. ස්ත්‍රී/ පුරුෂභාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

| |
|---|
| |

06. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

07. විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය : ……………………………………………………………………

08. උපන් දිනය :

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

09. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස

අවුරුදු: | | | මාස: | | | දින: | | |

10. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා/පෙළ) - පළමුවර

විභාග වර්ෂය :

විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස (සා/පෙළ) - දෙවනවර

විභාග වර්ෂය :

විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| *ආයතනය* | *පාඨමාලාවේ නම* | *කාලසීමාව* | *සහතිකය වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

12. සේවා පළපුරුද්ද (පූර්ව සේවා කාලය සහ ආයතන පිළිබඳ විස්තර) :

| | *සේවා කාලය* | | *පදවි නාමය* | *සේවා ස්ථානය* |
|---|---|---|---|---|
| | *සිට* | *දක්වා* | | |
| I. | ................. | ................. | ...................................... | ................................................ |
| II. | ................. | ................. | ...................................... | ................................................ |
| III. | ................. | ................. | ...................................... | ................................................ |

13. වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාලසීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

14. අමතර සුදුසුකම් :

| ව්‍යාපෘතිය | ආයතනය | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න.) ඔව් නම් විස්තර සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

.......................................................................................................................................................

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙහි සඳහන්කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකුවීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව මා දැන සිටිමි. තව ද යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

..................................................................,
අත්සන

දිනය : ...........................................

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : **(අදාළ නොවන වචන කපා හරින්න.)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය 2026.................................. මස .....................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ........................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ........................................................................................
තනතුර : ........................................................................................
ලිපිනය : ........................................................................................
(නිල මුද්‍රාව)
දිනය : ............................................................

***සටහන :*** අයදුම්පත සහතික කළයුත්තේ *ගැසට්* නිවේදනයේ 07 ඡේදයේ (ඇ) වගන්තියේ සඳහන් පරිදිය.

18. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................. නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියතු අයකු වන අතර ඔහු/ ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

...................................................... නිල මුද්‍රාව :
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : .......................................

ආයතන ප්‍රධානියාගේ නම : ..........................................................................
තනතුර : ..........................................................................
සේවා ස්ථානයේ ලිපිනය : ..........................................................................

01 - 264

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය**

ජාතික යොවුන් සේනාංකය

**2026 අධ්‍යයන වර්ෂය පළමු කණ්ඩායම සඳහා පුහුණුලාභීන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

දිවයින පුරා පිහිටි ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන ජාලය තුළ ජීවන කුසලතා පාඨමාලාව සඳහා බඳවාගැනීම් සිදු කෙරේ. මෙම පාඨමාලාව නේවාසික නොවන පූර්ණ කාලීන නොමිලේ පවත්වන පාඨමාලාවකි. පාඨමාලා කාලය මාස 3 ½ක් පමණි.

**පාඨමාලා සඳහා අයදුම් කිරීම:**

ජාතික යොවුන් සේනාංක පුහුණු පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන පහත දක්වා ඇත. ඔබ පුහුණු වීමට අපේක්ෂා කරන මධ්‍යස්ථානය තෝරාගෙන අදාළ අයදුම් පත්‍රය පුහුණු මධ්‍යස්ථානයට ගෙනවිත් බාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත දක්වා ඇති විද්‍යුත් ලිපිනයට අයදුම්පත යොමු කළ යුතු ය. අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීමේ දී ලිපි කවරයේ වම්පස **"2026 අධ්‍යයන වර්ෂය පළමු අදියර"** යනුවෙන් සඳහන් කොට ඉදිරිපත් කළ යුතු අතර, විද්‍යුත් තැපැලට යොමු කිරීමේ දී විද්‍යුත් තැපැලෙහි විෂය යන ස්ථානයට **"2026 වර්ෂය පළමු අදියර"** ලෙස සඳහන් කළ යුතු ය. **2026 ජනවාරි මස 26 දින අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වේ.** අදාළ අයදුම් පත්‍රය www.youthcorps.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

වැඩි විස්තර සඳහා: ඔබට ආසන්නතම පුහුණු මධ්‍යස්ථානය හෝ පහත දුරකථන අංකයන්ට අමතන්න

| | |
|---|---|
| දුරකථන අංක: | 011-2688 885/ 071-0377 377 |
| ෆැක්ස් අංකය: | 011-2684784 |
| ඊ - මේල් ලිපිනය: | application@youthcorps.lk |
| වෙබ් ලිපිනය: | www.youthcorps.lk |
| ෆේස්බුක් පිටුව: | National Youth Corps |
| ප්‍රධාන කාර්යාලය: | අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. |

අ.කළේ

අධ්‍යක්ෂ,
ජාතික යොවුන් සේනාංකය.

**නීතිඥ ආර්. නිශාන්ත පුෂ්පකුමාර,**
අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන සහ මුල්‍ය),
ජාතික යොවුන් සේනාංකය .

**ජාතික යොවුන් සේනාංක පාඨමාලාවෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ:**

I. ජාතික යොවුන් සේනාංක ජීවන කුසලතා සහතිකය.

II. ජීවන කුසලතා සඳහා ජාතික යොවුන් සේනාංක සහතිකයට අමතරව අන්තර්ජාතිකව පිළිගත් City & Guilds ආයතනය විසින් පිරිනමනු ලබන Assured Certificate in Professional Life Skills සහතිකය ලබාගැනීමේ හැකියාව (කොන්දේසි අදාළ වේ).

III. ක්‍රීඩා සහ කලා තරඟ ඉසව් සඳහා සහභාගී වීමේ අවස්ථාව (මධ්‍යස්ථාන/පළාත් සහ ජාතික).

IV. පිළිගත් ආයතනයක වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යොමු වීම සඳහා අවස්ථාව.

V. පාඨමාලාව අවසානයේ ඔබ තෝරාගත් වෘත්තීය පුහුණුවක් සඳහා යොමු වීමට රු.100,000.00ක් දක්වා ශිෂ්‍යත්වයක් (කොන්දේසි අදාළ වේ).

VI. නොමිලේ නිල ඇඳුම් සහ දෛනික පැමිණීමේ දීමනාව.

VII. ධෛර්‍ය අභ්‍යාස පුහුණුව (Adventure Based Training).

**ජාතික යොවුන් සේනාංක පාඨමාලාවේ සංයුතිය:**

I. ජීවන කුසලතා සංවර්ධනය (Life Skills Development)

II. මූලික ජීවන නිපුණතා සංවර්ධනය (Basic Life Competency)

III. තොරතුරු තාක්ෂණය (Information Technology)

IV. ඉංග්‍රීසි භාෂාව (English Language)

V. කලාව සහ ජීවිතය (Art & Life)

| *පළාත* | *අනු. අංකය* | *මධ්‍යස්ථානය* | *ලිපිනය* | *දුරකථන අංකය* |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | 1 | කටුනායක | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය ධර්මාලෝක මාවත, වලානගොඩ, කටුනායක. | 011-2260020 |
| | 2 | යක්කල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වැරැල්ල වත්ත, යක්කල, ගම්පහ. | 033-2233534 |
| | 3 | දිවුලපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වල්පිට, දිවුලපිටිය. | 033-2272875 |
| | 4 | බුලත්සිංහල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය බුලත්සිංහල. | 034-2282322 |
| | 5 | අත්තනගල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වතුපිටිවල, අත්තනගල්ල. | 033-2282232 |
| | 6 | රාජගිරිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය අංක 06, නාවල පාර, රාජගිරිය. | 011-2773989 |
| මධ්‍යම පළාත | 7 | ගම්පොල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය නාවලපිටිය පාර, කුඩාමකේ, ගම්පොල. | 081-2078177 |
| | 8 | නාඋල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය අරංගල, නාවුල. | 066-2246204 |
| | 9 | නුවරඑළිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය මීපිලිමාන, අඹේවෙල, නුවරඑළිය. | 052-2237416 |
| | 10 | සෙංකඩගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය සිරිමල් උයන, ඔගස්ටාවත්ත, මහනුවර | 081-2389134 |
| | 11 | යටිනුවර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය මුරුතලාව පාර, පිලපිටිය. | 081- 2410026 |
| | 12 | වලපනේ | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය හරස්බැද්ද, වලපනේ. | 052-2050010 |

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| දකුණු පළාත | 13 | සූරියවැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වෙනිවැල්ආර, සූරියවැව. | 047- 3133800 |
| | 14 | ගාල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වැකුණුගොඩ, බෝපේ, ගාල්ල. | 091- 2233182 |
| | 15 | අකුරැස්ස | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මාරඹේ, අකුරැස්ස. | 041-3131216 |
| | 16 | වීරකැටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නයිගල, හකුරුවෙල, වීරකැටිය. | 047-2257143 |
| | 17 | දික්වැල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඌරුගමුව, දික්වැල්ල. | 041-2255055 |
| | 18 | නෙළුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පියසේන ගමගේ ගොඩනැගිලි පරිශ්‍රය, ඇඹලේගෙදර, නෙළුව. | 070-2587416 |
| | 19 | අක්මීමන | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වීනමිත්‍ර ගම්මානය, කුරුඳුවත්ත, අක්මීමන. | 091-3121736 |
| | 20 | ලුණුගම්වෙහෙර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ලුණුගම්වෙහෙර. | 047-2239292 |
| | 21 | වීරවිල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වීරවිල. | 047-3128444 |
| ඌව පළාත | 22 | බණ්ඩාරවෙල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය බිඳුනුණුවැව, බණ්ඩාරවෙල. | 057-2222214 |
| | 23 | මහියංගනය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මාපාකඩවැව, මහියංගණය. | 055-2257118 |
| | 24 | තණමල්විල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, 3 කණුව, බෝදාගම, සූරිය ආර, තණමල්විල. | 0557716006 |
| | 25 | මොණරාගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කිරිමණ්ඩල මාවත, මොණරාගල. | 055-2055741 |
| | 26 | වැල්ලවාය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, යාලබෝව, වැල්ලවාය. | 055-2274157 |
| | 27 | සියඹලාණ්ඩුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මහකළුගොල්ල, සියඹලාණ්ඩුව. | 070-3538292 |
| උතුරු පළාත | 28 | මුලතිව් | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වඩ්ඩුවාකල්, මුලතිව්. | 021-2290428 |
| | 29 | මන්නාරම | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, තලෙයි මන්නාරම පාර, මන්නාරම. | 023-2251917 |
| | 30 | වව්නියාව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඉරට්ටෙපෙරියකුලම, වව්නියාව. | 024-2054558 |

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| වයඹ පළාත | 31 | කුලියාපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, දෙගම්මැද, වැවගම, කුලියාපිටිය. | 037-2283680 |
| | 32 | වාරියපොල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, උසාවිය පාර, වාරියපොල. | 037-2268375 |
| | 33 | මාවතගම | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඩෙන්වොර් වත්ත, මාවතගම. | 037-2298668 |
| | 34 | පඬුවස්නුවර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නුගවෙල හන්දිය, තුත්තිරිපිටිය, පඬුවස්නුවර. | 037-2291803 |
| | 35 | දොඩම්ගස්ලන්ද | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අලකොලමඩ, දොඩන්ගස්ලන්ද. | 037-2252655 |
| | 36 | වාලහේන | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වාලහේන, කාකපල්ලිය. | 032-2051991 |
| | 37 | වෙන්නප්පුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කමලසිරිමාවත,බෝලාන,වයික්කාල, වෙන්නප්පුව. | 031-2277199 |
| | 38 | අලව්ව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, විලගමුව, අලව්ව. | 037-2067885 |
| නැගෙනහිර පළාත | 39 | කුච්චවේලි | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සාලපේ ආරු, කුච්චවේලි. | 026-2228709 / 070-2587450 |
| | 40 | ගෝමරන්කඩවල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, විල්පනාකුලම, ගැමුණුපුර, ගෝමරන්කඩවල. | 026-4549428 |
| | 41 | අම්පාර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල, උහන පාර, අම්පාර. | 063-2224810 / 070-2587444 |
| | 42 | ත්‍රිකුණාමලය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ශ්‍රද්ධාපුර, චීන වරාය, ත්‍රිකුණාමලය. | 070-2587421 |
| | 43 | දෙහිඅත්තකණ්ඩිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ලිහිණියාගම, දමනේවෙල, දෙහිඅත්තකණ්ඩිය. | 027-2056723 |
| | 44 | වාලච්චේන | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, 18 වන සැතපුම් කණුව, කල්කුඩා, වාලච්චේන. | 065-3121085/ 070-3964998 |
| | 45 | සේරුවාවිල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සේරුවිල - සිරිදූව,සේරුනුවර. | 026-4549439 / 070-2587443 |
| සබරගමුව පළාත | 46 | කෑගල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මාවත, ගංගොඩවත්ත, කෑගල්ල. | 035-2223260 |
| | 47 | නිවිතිගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අම්බලන්දෙනිය, වටාපත පාර, නිවිතිගල. | 045-2279970 |
| | 48 | ගලිගමුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ආසියාදෙනිය, ගලිගමුව. | 035-2282993 |

| *පළාත* | *අනු. අංකය* | *මධ්‍යස්ථානය* | *ලිපිනය* | *දුරකථන අංකය* |
|---|---|---|---|---|
| සබරගමුව පළාත | 49 | ඇඹිලිපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ගම්උදා භූමිය, යෝධගම, ඇඹිලිපිටිය. | 047-2262399 |
| | 50 | බලංගොඩ | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බටුගම්මන, බලංගොඩ. | 077-6218530 |
| | 51 | දෙහිඕවිට | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කනංගම, දෙහිඕවිට. | 036-2267671 |
| උතුරු මැද පළාත | 52 | කැකිරාව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මහවැලි සංකීර්ණය, ඔළුකරඳ, කැකිරාව. | 025-2263297 |
| | 53 | ගලෙන්බිඳුණුවැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මොගොඩවැව, යකල්ල. | 025-2258355 |
| | 54 | කලාවැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ගල්නෑව, බුල්නෑව, කලාවැව | 025-2269946 |
| | 55 | අනුරාධපුරය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පාලඩිකුලම්, අනුරාධපුරය. | 070-2587432 |
| | 56 | මැදිරිගිරිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, යාය 03, නව නගරය පාර, මැදිරිගිරිය. | 027-2050477 |

01 - 315

---

**සංශෝධනයයි**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,469 හා 2025.12.26 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කර ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025 හි අයදුම්පත් කැඳවීමේ නිවේදනය සඳහා පහත සංශෝධන ඇතුළත් කරනු ලබන අතර එම නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026.02.20** දින පැය **21:00**ට අවසන් වේ.

සුදුසුකම් පරික්ෂා කිරීමේ දිනය **2026.01.23** දින ලෙස නොවෙනස්ව පවතී.

6.2 අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

| අනු. අංක | දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|---|
| 03 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්,<br>(අ) භෞතික විද්‍යාව හෝ ගණිතය පිළිබඳ විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (පුහුණු කාලය හැර) වසර 15ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;<br>හෝ<br>(ආ) භෞතික විද්‍යාව සහ ගණිතය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (පුහුණු කාලය හැර) වසර 15ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 03 (I) | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාඥ | 02 | (අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම;<br>හෝ<br>(ආ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත වීම. |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 21 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

01 - 341

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.